සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்

**Sabaragamuwa Provincial Department of Education**

| | |
|---|---|
| **තෙවන වාර පරීක්ෂණය - 2017**<br>**Third Term Test - 2017** | **11ශ්‍රේණිය**<br>**Grade 11** |
| **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - I**<br>**Information Communication Technology – I** | **පැය එකයි**<br>One hour |

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 - 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4)පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරන්න

01. පිළිවෙළින් විධානපේළි අතුරු මුහුණත් සහ චිත්‍රක පරිශීලක අතුරු මුහුණත් බිහිවූ පරිගණක පරම්පරා වන්නේ ,

(1) පළමු පරම්පරාව සහ තෙවන පරම්පරාවය.

(2) සිව්වන පරම්පරාව සහ පළමු පරම්පරාවය.

(3) සිව්වන පරම්පරාව සහ තෙවන පරම්පරාවය.

(4) තෙවන පරම්පරාව සහ සිව්වන පරම්පරාවය.

02. පහත දැක්වෙන පිළිතුරු අතරින් දැක්වීමේ උපාංග පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) මෙහෙයුම් යටිය (Joy Sticks), තීරු කේත කියවනය (Bar code reader), මූසිකය (Mouse)

(2) මූසිකය (Mouse), ස්පර්ශක සංවේදී තිරය (Touch Screen), ආලෝක පෑන (Light Pen)

(3) ස්පර්ශක සංවේදී තිරය (Touch Screen), යතුරු පුවරු (Key board), ආලෝක පෑන (Light Pen)

(4) ආලෝක පෑන (Light Pen), මෙහෙයුම් යටිය (Joy Sticks), තීරු කේත කියවනය (Bar code reader)

03. මෙහෙයුම් පද්ධතියේ දෘඩාංග කළමණාකරන කාර්යය හරහා සිදුකරන කාර්යයක් නොවන්නේ,

(1) පරිගණක ජාල කළමණාකරනය (2) ගොනු කළමණාකරනය

(3) විධාන පේළි කළමණාකරනය (4) ක්‍රියාවලි කළමණාකරනය

04. $254_8$ යන අෂ්ටමය සංඛ්‍යාවට තුල්‍ය සංඛ්‍යාවක් වන්නේ,


(1) $240_{10}$ (2) $11101001_2$ (3) $AC_{16}$ (4) $010101101_2$

05. $107120_8$ හි වැඩිම වෙසෙසි අගය සහ අඩුම වෙසෙසි අගය පිළිවෙළින් දැක්වෙනුයේ,

(1) 1 සහ 0 (2) 1 සහ 2 (3) 0 සහ 0 (4) 1 සහ 1

ictnotes.org

06. මෙම තාර්කික පරිපථයට අදාළ සත්‍යතා වගුව ඔබට ලබා දී ඇත.





| A | B | C |
|---|---|---|
| 0 | 0 | w |
| 0 | 1 | x |
| 1 | 0 | y |
| 1 | 1 | z |

w , x , y , z යන අක්ෂර සඳහා වඩාත් ගැලපෙන පිළිතුර වන්නේ,

(1) 0,0,0,0 (2) 0,1,1,0 (3) 1,1,1,1 (4) 1,0,1,0

07. A සහ B ආදාන ලෙස ද, C ප්‍රතිදානය ලෙස ද,ඇති පහත තාර්කික ද්වාරයේ ප්‍රතිදානය 0 වීමට නම්,




(1) A සහ B දෙකම 1විය යුතුය.

(2) A සහ B අතුරෙන් 1 ක් පමණක් 0 විය යුතුය.

(3) A සහ B අතුරෙන් 1 ක් පමණක් 1 විය යුතුය.

(4) A සහ B දෙකම 0 විය යුතුය.

08. ප්‍රකාශ මාධ්‍ය පමණක් ඇතුළත් උපාංග යුගලය තෝරන්න.

(1) දෘඩ තැටි (Hard Disk), නම්‍ය තැටිය (Floppy Disk)

(2) සංයුක්ත තැටිය (CD),සංඛ්‍යාංක බහුවිධ තැටිය (DVD)

(3) බ්ලූරේ තැටිය (Blu-ray Disk),චුම්බක පටි (Magnetic Tape)

(4) සැනෙළි මතකය (Flash Memory),සසම්භාවී ප්‍රවේශ මතකය (RAM Chip)

09. පහත දැක්වෙන ප්‍රකාශ සලකා බලන්න

A - අධෝරක්ත කිරණ වලට වඩා වැඩි දුරක් ගුවන් විදුලි තරංග වලින් දත්ත සම්ප්‍රේෂණය කළ හැක.

B - තඹ රැහැන් වල මිල ප්‍රකාශ තන්තු රැහැන් වල මිලට වඩා වැඩි වේ.

C - ස්විච්යට වඩා නාභියෙහි හුවමාරු වේගය අඩුය.

ඉහත කුමන ප්‍රකාශය/ප්‍රකාශ සත්‍ය වේද?

(1) A හා C පමණි (2) B පමණි (3) B හා C පමණි (4) C පමණි

10. C අනුලක්ෂණයේ ඇස්කි කේතය (ASCII) 1000011 නම් G හි ඇස්කි කේතය (ASCII) වන්නේ ,

(1) 1100100 (2) 1000111 (3) 1001111 (4) 1000011

11. http://www.schoolnet.sch.lk/2017/winners.html යන URL හි වසම් නාමය වන්නේ ,

(1) http (2) html (3) schoolnet.sch.lk (4) www

ictnotes.org

★ 12, 13 සහ 14 ප්‍රශ්න සඳහා පහත වගුව සලකන්න. පොත් සාප්පුවක අලෙවි වූ පොත් සහ අනෙකුත් ලිපිද්‍රව්‍ය පිළිබඳ තොරතුරු වගුවේ ඇතුලත් ය .

| Product_ID | Product_description | Quantity | Unit_price |
|---|---|---|---|
| P1 | Books | 20 | 75 |
| P2 | A4 bundles | 5 | 500 |
| P3 | Pencils | 25 | 15 |
| P4 | Pens | 15 | 20 |

12. මෙම වගුවේ රෙකෝඩ ගණන සහ ක්ෂේත්‍ර ගණන පිළිවෙළින් ,

(1) 4,5 (2) 5,5 (3) 5,4 (4) 4,4

13. "Unit_price"සඳහා වඩාත් සුදුසු දත්ත ප්‍රරූපය වන්නේ ,

(1) පාඨ (Text) (2) මුදල් (Currency)

(3) සංඛ්‍යාත්මක (Integer) (4) දිනය සහ වේලාව (Date & Time)

14. ප්‍රාථමික යතුර සඳහා වඩාත් සුදුසු වන්නේ ,

(1) Product_ID (2) Quantity (3) Unit_Price (4) Product_description

15. පාසලේ දත්ත පාදකයේ ඇති සියළුම අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලයට ආරාධනා පත්‍රයක් යැවීම සඳහා වදන් සැකසුම් මෘදුකාංගය තුල ඇති මෙවලම වනුයේ ,

(1) Thesaurus (2) Hyperlink (3) Mail merge (4) Find and Replace

16. වදන් සැකසුම් ගොනුවක ඇති සියළු දේ තෝරා ගැනීම සඳහා අදාල කෙටි මං යතුර වන්නේ ,

(1) Ctrl+X (2) Ctrl+F (3) Ctrl+V (4) Ctrl+A

17. පහත දක්වා ඇති A වගන්තිය B මගින් පෙන්වන වගන්තිය ලෙස හැඩසව් කිරීම සඳහා භාවිතා කර ඇත්තේ වදන් සැකසුම් මෘදුකාංගයෙහි කුමන මෙවලම භාවිතා කරමින්ද

A – He won 2nd Place B – *He won 2$^{nd}$ Place*

(1) යටිඉර සහ යටි ලකුණ ( Underline and subscript)

(2) ඇලකිරීම සහ උඩු ලකුණ ( Italic and Superscript)

(3) යටිඉර සහ තද පැහැ ගැන්වීම (Underline and Bold)

(4) ඇලකිරීම සහ අනුඡේදනය (Italic and Indentation)

ictnotes.org

18. HTML ලේඛණයක් තුල අධිසන්ධානයක් (Hyperlink)යොදන නිවැරදි ක්‍රමය වන්නේ,

(1) <a>http://www.nie.com </a>

(2) <a name="http://www.nie.com">Syllabus</a>

(3) <a href=" http://www.nie.com">Syllabus </a>

(4) <a href=" http://www.nie.com"><Syllabus</a>

19. HTML ලේඛනයක ව්‍යුහය අනුව මාතෘකා උසුලනය (title tag) අඩංගු වන්නේ,

(1) <Body>සහ </Body>තුලයි.

(2) <Head>සහ </Head>තුලයි.

(3) <Table>සහ </Table>තුලයි.

(4) <li>සහ </Li>තුලයි.

20. පහත දැක්වෙන මෘදුකාංග අතරින් අන්තර්ජාලයට සම්බන්ධ පරිගණයක ක්‍රියාකාරිත්වය අඩාල කරන හානිකර මෘදුකාග පමණක් ඇතුලත් පිළිතුර වන්නේ,

(1) පරිගණක වර්ම්ස් , අයාචිත තැපැල , ෆිෂින්

(2) ඔත්තුකරුවන් , වෙබ් අතරික්සු , විද්‍යුත් තැපැල

(3) පරිගණක වයිරස , ආයාචිත තැපැල , විද්‍යුත් තැපැල

(4) විද්‍යුත් තැපැල , පරිගණක වර්ම්ස් , ආයාචිත තැපැල

21. වළාකුළු පරිගණක සම්බන්ධ පහත ප්‍රකාශ සලකා බලන්න .

A. සේවාලාභියාට අවශ්‍ය යෙදුම් මෘධුකාංග තම පරිගණකයේ ස්ථාපිත කිරීම අනවශ්‍ය නිසා මෘධුක්‍රාංග සඳහා වියදම අඩුවීම.

B. අඩු වේග අන්තර්ජාල සම්බන්ධවලදී පවා ක්‍රියාකාරිත්වය එක සේ පවතී .

C. මෘධුකාංග ක්ෂණිකව යාවත්කාලීන වීම් නිසා නඩත්තු ගැටළු අවම වේ .

(1) A සහ B පමණි. (2) B සහ C පමණි. (3) A සහ C පමණි. (4) A,B සහ C සියල්ලම.

22. ශබ්ද ගොනු හැඩසව් (file format) පමණක් අඩංගු වරණය කුමක්ද?

(1) PNG,RAW,MP3

(2) WAV,MP2,MP3

(3) RAW,JPEG,FLAC

(4) PPTX,BMP,PNG



ictnotes.org

★ **පහත අංක 23සිට 24 දක්වා ප්‍රශ්න සඳහා පහත පැතුරුම්පත් කණ්ඩය භාවිතා කර ඇත.**

| | A | B | C | D |
|---|---|---|---|---|
| 1 | | | | |
| 2 | 1 | 2 | 3 | |
| 3 | 4 | 3 | | |
| 4 | 5 | | | |
| 5 | | | | |

23. \$A\$2+A3 යන සූත්‍රය A4 කෝෂයෙහි අඩංගු වේ. මෙම සූත්‍රය A5 කෝෂයට පිටපත් කළේ නම් කුමන අගයක් පෙන්නුම් කරනු ලබයිද?

(1) 5 (2) 6 (3) 2 (4) 4

24. C2 කෝෂයේ =SUM(A2:B2) සූත්‍රය ලියා තිබේ.C2 කෝෂයේ ඇති C3 කෝෂය වෙත පිටපත් කළේ නම් C3 කෝෂයේ ලියවෙන්නේ පහත සඳහන් දෑ අතුරින් කවරක්ද?

(1) =SUM(A3:B3) (2) =SUM(A2:A3)

(3) =SUM(A2:B2) (4) =SUM(B2:B3)

25. පුද්ගලයෙකුගේ මුළු ආදායමින් වැය කරන්නාවූ විවිධ වියදම් ප්‍රතිශතයන් දැක්වීම සඳහා වඩාත්ම සුදුසු ප්‍රස්තාර වර්ගය කුමක්ද?

(1) රේඛා ප්‍රස්තාර( Line Chart) (2) ස්ථම්භ ප්‍රස්තාර ( Coloumn Chart)


(3) දඬු ප්‍රස්තාර (Bar Chart) (4) වට ප්‍රස්තාර (Pie Chart)

26. සමර්පන මෘදුකාංගයකට උදාහරණයක් නොවන්නේ?

(1) Apple Keynote (2) Microsoft Power point

(3) Oracle (4) Libreoffice Impress

27. පහත දක්වා ඇති සමර්පන මෘදුකාංගයෙහි දසුන් තීරුවේ A අක්ෂරයෙන් දැක්වෙන්නේ




(1) Normal View(සාමාන්‍ය දසුන)

(2) Reading View(කියවීම් දසුන)

(3) Slide Shorter View (කදා සුබෙදුම් දසුන)

(4) Slide Show(සමර්පන රාමු දසුන)

28. වෙබ් අඩවියක් නැංවීම සඳහා (Hosting) අත්‍යවශ්‍ය **නොවන්නේ** පහත සඳහන් කවරක්ද?

(1) වෙබ් අතිරික්සුව (Web Browser) (2) වෙබ් සේවාදායකය (Web Server)

(3) IP ලිපින (IP Address) (4) වෙබ් අඩවියේ අන්තර්ගතය (Content)

ictnotes.org

29. විශාන් තම මිතුරෙකුට විද්‍යුත් තැපැල් ලිපියක් යවන ලදී. ඔහු යවන ලද ලිපිය, ඔහුගේ ඉ-තැපැල් ගිණුමෙහි තැන්පත් වන ෆෝල්ඩරය කුමක්ද?

(1) inbox (2) Sent (3) Draft (4) Trash

30. පහත දැක්වෙන අසම්පූර්ණ වාක්‍ය සලකා බලන්න.

----------------- යනු පද්ධති සංවර්ධන ජීවන චක්‍රයේ (SDLC)එක් ප්‍රධාන අවස්ථාවකි. ඉහත වාක්‍යයේ හිස්තැන් පිරවීම සඳහා වඩා යෝග්‍ය කොටස වන්නේ

(1) සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම

(2) පද්ධති පරීක්ෂාව හා දෝෂ නිරාකරනය

(3) පරීක්ෂණ දත්ත එක්රැස් කිරීම

(4) භාවිත අත්පොත ලිවීම

31. පාසලක පුස්තකාල කටයුතු ස්වයංක්‍රීය කරණය කිරීම සඳහා නව පද්ධතියක් පිහිටුවීමට අදහස් කරයි.මෙහිදී වඩාත් සුදුසුම පද්ධති පිහිටුවීම් ක්‍රමයක් වන්නේ

(1) සෘජු පිහිටුවීම (2) සමාන්තර පිහිටුවීම

(3) නියමුමය පිහිටුවීම (4) අදියරමය පිහිටුවීම

32. නොමිලයේ භාගත කර ගත හැකි වෙබ් සංස්කාරක මෘදුකාංගයක් නොවන්නේ

(1) Adobe Dream weaver (2) CKeditor (3) Bluegriffon (4) Kompozer

33. ඡායාරූප සංස්කරණ මෘදුකාංගයක පහත දැක්වෙන මෙවලම මඟින් සිදු කරනුයේ



(1) රූපයේ පසුබිම තෝරා ගැනීමට

(2) තේරීමට අවශ්‍ය කොටස වටයමින් තෝරා ගැනීමට

(3) එකම වර්ණයෙන් යුතුවූ එකට සම්බන්ධ කොටස් තෝරා ගැනීමට

(4) අවශ්‍ය කොටස අවශ්‍ය හැඩයෙන් තෝරා ගැනීමට

34. පහත දැක්වෙන ඒවායින් කවරක් පරිගණක වෛරස් සඳහා මූලාශ්‍ර විය හැකිද?

A සුපරීක්ෂකය(Scanner)

B චෞර මෘදුකාංග (Pirated software)

C සැනෙලි ධාවක (Flash Drive)

(1) A හා B පමණි (2) A හා C පමණි (3) B හා C පමණි (4) A,B,C සියල්ල

35. අංකිත බෙදුම (digital divide) යා කිරීම සඳහා උදව් වන්නේ පහත සඳහන් කවරක්ද?

A-පාසල් වල පරිගණක විද්‍යාගාර පහසුකම් ලබාදීම

B-ග්‍රාමීය ජනතාව සඳහා අන්තර්ජාල සම්බන්ධතා සහිත ප්‍රජා මධ්‍යස්ථාන පිහිටුවීම

C-සාමාන්‍ය පෙළ විභාගය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂය තෝරා ගැනීමට සිසුන් උනන්දු කිරීම

(1) A පමණි (2) A හා C පමණි (3) B හා C පමණි (4) A,B,C සියල්ල

ictnotes.org

★ පහත පැස්කල් ක්‍රමලේඛය සලකන්න.

```
program repetition(input,output);
var X:integer
begin
        x:=2
        repeat
                write (x)
                x:= x+2;
        until x=6;
end.
```

36. ඉහත ක්‍රමලේඛය ක්‍රියාත්මක වූ පසු ලබාදෙන ප්‍රතිදානය කුමක්ද?

(1) 2,4 (2) 2,4,6 (3) 4,6 (4) 1,2,3

★ සිසුන් 10 දෙනෙකු විසින් ගණිතය විෂයට ලබා ගත් ලකුණු ආදානය කර එම ලකුණු වල සාමාන්‍ය අගය සොයා එම සාමාන්‍ය ලකුණු අගය 50 >= නම් ඒ අනුව ප්‍රතිදානය නිකුත් කිරීම සඳහා සකස් කරන ලද ගැලීම් සටහනක් පහත වේ. ඒ ඇසුරෙන් 37,38 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

37. ඉහත ❶❷❸ ලේබල සඳහා නිවැරදි පිළිතුරු පිළිවෙලින් ඇතුළත් පිළිතුර වන්නේ

(1) 49 , Good, Bad

(2) 50, Bad, Good

(3) 50,Good,Bad

(4) Bad,50,Good

38. ගැලීම් සටහනේ දී ඇති පාලන ව්‍යුහ වලට අනුව පහත කුමක් නිවැරදි වේද?


(1)පුනර්කරණය තුළ වරණය පැවතීම

(2)වරණය තුළ පුනර්කරණය පැවතීම

(3)පුනර්කරණය තුළ පුනර්කරණය පැවතීම

(4)වරණය තුළ වරණය පැවතීම

ictnotes.org




39. වලාකුළු පරිගණක භාවිතයේ වාසි ලෙස සැලකිය හැක්කේ පහත සඳහන් ඒවායින් කවරක්ද?

A නොකඩවා පවතින අන්තර්ජාල පහසුකම් අවශ්‍ය වීම

B මෘදුකාංග සඳහා අඩු වියදමක් දැරීමට සිදුවීම

C මෘදුකාංග ක්ෂණිකව යාවත්කාලීන කිරීමට හැකිවීම

(1) A පමණි (2) A හා B පමණි (3) B හා C පමණි (4) A,B,C සියල්ල

40. ඉ-රාජ්‍ය සේවා යටතේ රජයක් විසින් වෙනත් රාජ්‍ය වෙනුවෙන් ලබා දෙන සේවාවක් සඳහා උදාහරණයක් වන්නේ

(1) දේශීය ව්‍යාපාර ලියාපදිංචියට අවශ්‍ය උපදෙස් ලබා දීම

(2) ශ්‍රී ලංකා රේගු විස්තර ලබා දීම

(3) වාහන බලපත්‍ර ලබා දීම

(4) ණය පහසුකම් ලබාදීම සම්බන්ධයෙන් තොරතුරු ලබා දීම



ictnotes.org